# කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය, වැලිගත්ත, හම්බන්තොට
# පුරප්පාඩු
# (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා පමණි)

මෙම ආයතනයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන වල දැනට **ස්ථිර සේවයේ නියුතු, තනතුරෙහි තහවුරු කරන ලද සේවක භවතුන්ගෙන් පමණක්** අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කළ අයදුම්පත් තමා සේවය කරන ආයතනයේ ලේකම් / ලේඛකාධිකාරී / අධ්‍යක්ෂ / මණ්ඩපාධිපති මගින් 2026.01.20 දින හෝ එදිනට පෙර "නියෝජ්‍ය ලේඛකාධිකාරී, කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂිතාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය, වැලිගත්ත, හම්බන්තොට." වෙත ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන්නට සැලැස්විය යුතුය. අසම්පූර්ණ, අපැහැදිලි හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර එසේ ප්‍රතික්ෂේප වූ අයදුම්පත් කුමන හේතුවක් නිසාවත් නැවත සළකා බලනු නොලැබේ.

අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට පහත දැක්වෙන ඒ ඒ තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද ලබා තිබිය යුතු අතර, එම සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කිරීම සඳහා අදාල සහතික වල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා එවනු නොලබන සහ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**01. තනතුර:- කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු) III ශ්‍රේණිය**

01. අ.පො.ස.(සා.පෙළ) විභාගයේ
    - සිංහල භාෂාව/දෙමළ භාෂාව
    - ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය
    - ගණිතය

    යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයක් එක් වරක දී සමත් වී තිබීම

    **සහ**

02. අ.පො.ස. (උ.පෙළ) විභාගය එක් වරක දී සියලු විෂයන් සමත් වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

    **පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.**

    අ. පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 06කට නොඅඩු පරිගණක යෙදුම් භාවිතය පිලිබඳ පිළිගත හැකි සුදුසුකමක් තිබීම

    **සහ**

    ආ. පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිලිබඳ වසර 02 ක පළපුරුද්දක් තිබීම

    **සහ**

03. ගබඩාකරණය පිළිබඳ අවම වශයෙන් එක් අවුරුදු පළපුරුද්ද සහ/හෝ අ.පො.ස (ස.පෙළ) විභාගයේ වාණිජ්‍යය විෂය සමත්වීම හෝ අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ගණකාධිකරණ විෂය සමත් වීම.

**සටහන:** උසස් අධ්‍යාපන ආයතනය විසින් තීරණය කරනු ලබන පරිදි ආරක්ෂක තැන්පතුවක් (Security deposit) තැබිය යුතුය.

**වැටුප් ක්‍රමය :** U MN 1 (III) - Rs. 49,475-17x540-58,655 p.m.
**බඳවා ගැනීම :**ලිඛිත පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

අධ්‍යක්ෂ
කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය
වැලිගත්ත නවනගරය, හම්බන්තොට
2026.01.06